පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය- ඉතිහාසය

23 සතිය

7 ශ්‍රේණිය

සැකසුම : එම්. ආර්. සී. දිල්රුක්ෂි
ර/මහඹමාර විද්‍යාලය

## 2 ඒකකය-අපේ කීර්තිමත් රජවරු

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

අංක 1- 5 දක්වා ප්‍රශ්න වලට හිස්තැනට සුදුසු පිළිතුර වරහන් තුළින් තෝරා තිත් ඉරි මත ලියන්න.

01. පළමුවන සේන රජතුමාගේ කාලයේදී .................................... නම් පාණ්ඩ්‍ය රජු ලංකාව ආක්‍රමණය කළේය.

02. පරිපාලන කටයුතු මෙහෙයවූ නිලධාරීන් .................................... හැඳින්විණි.

03. කුඩා කාලයේදී කිත්ති කුමරු යනුවෙන් හැඳින්වූයේ .................................... ය.

04. පරාක්‍රමපුරය වර්තමානයේ හැඳින්වෙන්නේ .................................... යනුවෙනි.

05. ගල්පොත ශිලා ලිපිය පිහිටුවන ලද්දේ .................................... රජතුමාය.

( විජයබාහු රජතුමා, පඬුවස්නුවර, නිශ්ශංකමල්ල රජතුමා, ශ්‍රී මාර ශ්‍රී වල්ලභ, රටලද්දන්, වාකිරිගල )

ප්‍රශ්න අංක 6 - 10 දක්වා දී ඇති ප්‍රකාශය හරි නම් √ ලකුණ ද වැරදි නම් × ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.

06. ධාතුසේන රජතුමා මෞර්ය වංශිකයෙකි. ( )

07. පළමුවන සේන යනු අග්ගබෝධි රජුගේ පුතෙකි. ( )

08. රජතුමා මධ්‍ය පාලනයේ පියා විය. ( )

09. චෝල රාජ්‍යයේ අගනුවර වන්නේ මදුරාපුරයයි. ( )

10. පරාක්‍රමබාහු රජතුමාගේ මව රත්නාවලී දේවියයි. ( )

ප්‍රශ්න අංක 11 - 15 දක්වා Þ කොටසේ දක්වෙන ප්‍රකාශ වලට ගැළපෙන පිළිතුරු ඊ කොටසෙන් තෝරා යා කරන්න.

| Þ | ඊ |
|---|---|
| 11. ක්‍රි.ව. 684 දී හත්ථදාඨ රජු පරාජයට පත්කොට බලය ලබාගත් පාලකයා | 1. ඉරිපින්නියාව |
| 12. පාණ්ඩ්‍ය ආක්‍රමණය මෙහෙයවූ කුට්ඨක සෙනෙවියා ගැන සඳහන් සෙල්ලිපිය පිහිටි ස්ථානය | 2. පරාක්‍රම පාණ්ඩ්‍ය |
| 13. දසගම් පාලනයට හා අපරාධ නීති නඩු විසඳීමට අදාළ නීති රැසක් ඇතුළත් සෙල්ලිපිය | 3. මානවම්ම රජු |
| 14. අනුරාධපුර රාජධානිය පාලනය කළ අවසන් සිංහල පාලකයා | 4. වේවැල්කැටිය |
| 15. පරාක්‍රමබාහු රජතුමාගේ පාලන කාලයේදී පාණ්ඩ්‍ය රාජ්‍යයේ පාලකයා | 5. v වන මිහිඳු රජු |

අංක 16 සිට 20 තෙක් ප්‍රශ්න වලට වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

16. අශ්වයන් පිළිබඳ කාර්යාංශයේ ප්‍රධානියා,

(i) හති අදෙකය
(ii) අශ අදෙකය
(iii) පරුමකය
(iv)නට අදෙකය

17. රාජකීය දීමනා පිළිබඳ සඳහන් ශිලාලිපි විශේෂයක් නොවන්නේ,
(i) අත්තාණි කණු
(ii) ගාවුත කණ
(iii) පුවරු ලිපි
(iv) ආසන ලිපි

18. ශ්‍රී ලංකාවට වඩාත් ලංව පිහිටි දකුණු ඉන්දියානු රාජධානිය වන්නේ,

(i) චෝල (ii) කාලිංග (iii) පාණ්ඩ්‍ය (iv) පල්ලව

19. මහා විජයබාහු රජතුමා පිළිබඳ හැදෑරීමේදි වැදගත් වන මූලාශ්‍රයක් නොවන්නේ,

(i) පනාකඩුව තඹ සන්නස
(ii) අඹගමුව ශිලා ලිපිය
(iii) මහාවංසය
(iv) සමන්ත පාසාදිකාව

20. නිශ්ශංකමල්ල රජතුමා කරවූ ගොඩනැගිලි වලට අයත් නොවන්නේ,

(i) රන්කොත් වෙහෙර

(ii) පබළු වෙහෙර

(iii) පොළොන්නරුව කිරි වෙහෙර

(iv) උත්තරාරාමය

## II කොටස

පහත දැක්වෙන ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

01. ලම්බකර්ණ හා මෞර්ය රජ පෙළපත් අතර දේශපාලන ගැටුම් පැවති සමයේ මෙරට දේශපාලන ක්ෂේත්‍රය තුළ දක්නට ලැබුණු කැපී පෙනෙන ලක්ෂණ 2ක් නම් කරන්න.

02. ශ්‍රී මාර ශ්‍රී වල්ලභ නම් ආක්‍රමණිකයා සමඟ කළ සටනේදී මියගිය කුමාරවරුන් දෙදෙනාගේ නම් ලියන්න.

03. පළමුවන සේන රජතුමා නව අංගයන් එක් කළ විහාරාරාම 3ක් නම් කරන්න.

04. රජකම උරුම වීමේ ක්‍රම 2ක් ලියන්න.

05. රජුට අයත් කාර්යයන් 3ක් නම්
කරන්න. 06. පෙර සිරිත යනු කුමක්ද?

07. අනුරාධපුර යුගයේ රජවරු සමාජ සුබසාධනය පිළිබඳ විශේෂ උනන්දුවක් දැක්වූ බවට උදාහරණ 3ක් ලියන්න.

08. ශ්‍රී ලංකාවට බලපෑම් එල්ල කළ දකුණු ඉන්දියානු රාජ්‍යය 3ක් නම් කරන්න.

09. චෝලයන්ට විරුද්ධව රුහුණේ දේශපාලන බලයක් ගොඩනැගීම
වැළැක්වීමට
අනුගමනය කළ උපායන් 2ක් ලියා දක්වන්න.

10. පහත දැක්වෙන රජවරුන් සිදුකළ සේවාවන් 3 බැගින් ලියා
දක්වන්න. විජයබාහු රජතුමා
පරාක්‍රමබාහු රජතුමා
නිශ්ශංකමල්ල රජතුමා